// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1951/28 - 2016 ජනවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2016.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2016 ජනවාරි මස 29 වැනි දින සිට මෙහි උපලේඛනයේ III වන තීරයේ සඳහන් කාල සීමාවන් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

රවි කරුණානායක,<br>
මුදල් අමාත්‍ය.

2016 ජනවාරි මස 28 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| I වැනි තීරය | | | | II වැනි තීරය | III වැනි තීරය |
|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | වලංගු කාලය |
| 1. | 10.05 | 1005.90 | බඩ ඉරිඟු - අනෙකුත් | 10% | 2016.02.29 |
| | 10.07 | 1007.10 | ඉදල් ඉරිඟු ඇට (සොගම් - බීජ) | 10% | 2016.02.29 |
| | | 1007.90 | ඉදල් ඉරිඟු ඇට (සොගම්) - අනෙකුත් | 10% | 2016.02.29 |
| 2. | 15.16 | 1516.20 | ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරිවූ කොටස් | කි. ග්‍රෑමයට රු. 175/- | 2016.04.28 |
| 3. | 15.17 | 1517.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 175/- | 2016.04.28 |

02 - 436

1A - PG 2818 — 506 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*